# සරණාගතයන් ලෙස පිළිගැනීම සඳහා ඉල්ලුම් කිරීමට බලාපොරොත්තු වන තාක්ෂණික පුහුණුව ලබන්නන් සඳහා

2018 පෙබරවාරි

අධිකරණ අමාත්‍යාංශය සහ ආගමන දෙපාර්තුමේන්තුව

අධිකරණ අමාත්‍යාංශය මේ වන තෙක්, නිත්‍යානුකූලව ජපානයේ රැඳී සිටින විදේශිකයින් විසින් සරණාගතයන් ලෙස පිළිගැනීම සඳහා වූ ඉල්ලීමක් සිදුකල විට, ඉල්ලුම් කල දින සිට 6 මසක් ගෙවීගිය පසු, ප්‍රතිපත්තියක් ලෙස රැකියා අවසරය ලබාදෙන ස්ථාවරයේ සිටියේය. නමුත්, මෙම වසරේ ජනවාරි මස 15 දින, සරණාගතයින් ලෙස පිළිගැනීමේ ක්‍රියාවලිය තුල අයදුම්කරුට ලබාදෙන්නා වූ ජපානයේ රැඳී සිටීමේ සුදුසුකමේ ක්‍රියාකාරිත්වය සමාලෝචනය කරන ලදී.

නියමාකාරයෙන් පැවසුවහොත්, තාක්ෂණික පුහුණුව ලබන්නන් සම්බන්ධයෙන් ගත් කල, පුහුණුව ලබන තැනින් අතුරුදහන් වීමක් සිදු වූ පසු හෝ, සැලසුම් කල තාක්ෂණික පුහුණුව අවසන් කල පසු, සරණාගතයන් ලෙස පිළිගැනීම සඳහා වූ ඉල්ලීමක් කල අවස්ථාවේදී, ඉල්ලීම කල දින සිට 6 මසක් ගතවුවද, ප්‍රතිපත්තියක් ලෙස රැකියා අවසරය ලබා නොදෙන ස්ථාවරයට පැමිණියේය.

(සටහන 1) තාක්ෂණික පුහුණුව ලබමින් සිටියදී සරණාගතයන් ලෙස පිළිගැනීම සඳහා ඉල්ලීම් කල හැකිය.

(සටහන 2) සරණාගත සම්මුතියට අනුව සරණාගතයෙකු වීමේ හැකියාව වැඩිනම්, එසේත් නැතහොත් එම තැනැත්තාගේ රටේ තත්වය වැනි දෑ සලකා බලා, මානුෂීය අවධානයේ අවශ්‍යතාවය වැඩිනම්, මෙම අවස්ථාවන්ට පමණක් සීමාකර, රැකියා අවසරය ලබා දෙනු ලැබේ.

ඊට අමතරව, පුහුණුව ලබන ආයතනයේදී තාක්ෂණික පුහුණු නීති සහ රෙගුලාසි උල්ලංඝනය වන බව ඔබට හැඟෙන අවස්ථාවන් හෝ, තාක්ෂණික පුහුණුව කරගෙන යාමේදී අනවශ්‍ය බියක් ඇතිවන අවස්ථාවන්, යනාදිය පිළිබඳව උපදෙස් සාකච්චා කිරීමට අවශ්‍යනම්, කරුණාකර විදේශීක තාක්ෂණ පුහුණු ආයතනයෙන් උපදෙස් ලබාගන්න ("තාක්ෂණික පුහුණුව ලබන්නන්ගේ අත්පොත" 64 වන පිටුවේ සිට පරිශීලනය කරන්න).